# අල්ලස හා දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක්

වර්තමාන සමාජයේ අල්ලස හා දූෂණය රජයන සමාජ වතාවරණයක් ගොඩනැගී ඇත. මෙම හේතුව නිසා රාජ්‍ය පාලන කටයුතු මෙන්ම රටේ ආර්ථිකයද ව්‍යාකූල තත්ත්වයක පවතී. අල්ලස යනු සමාජයේ යම් කෙනෙකුට යම් අවශ්‍යතාවක් නිසි අයුරින් කරගත නොහැකි වීම නිසා ඔහු හෝ ඇය ඒය කෙරෙහි හෝ ඉටු කර ගැනී-මට උත්සහ දරන්නේ එම අවශ්‍යතාව ඉටු කරගත හැකි පුද්ගලයෙකු හට යම් මුදලක් හෝ වටිනා යමක් ප්‍රදානය කිරීමෙන්ය. එය ව්‍යවහාර කරනු ලබන්නේ අල්ලස යනුවෙනි. දූෂණය නැතහොත් දූෂිත කිරීම යනු යම් පරිසර තත්ත්වයක් හෝ යම් පුද්ගලයෙකු හට නොයෙක් හිරිහැර දෙමින් යම් අයෙකු විසින් ඔහුව හෝ ඇයව හෝ එම පරිසරය විනාශයට පත් කිරීමයි. මෙම තත්ත්ව වළක්වා ගැනීමට උදෙසා ක්‍රියාත්මක කර ඇති ආයතනද අල්ලස හා දූෂණයට යටවී ඇත. මෙම නිසා සමාජයට ඇතිවිය හැකි හානිය ද සුළුපටු නොවේ. නමුත් පැරණි සමාජයේ මෙවැනි වතාවරණයක් නොතිබුණි. ඒ සමාජය අල්ලස හා දූෂණය මුලිනුපුටා දමා ඇති සමාජයක් බවට යම් යම් ලිපි ලේඛන (ශිලා ලේඛන) සාක්ෂි දරයි. එයට කදිම නිදසුනක් ලෙස ක්‍රිස්තු වර්ෂයෙන් 4 වන සියවසේ දී රචනා කරන ලද සෙල් ලිපියක සංකේතානු-සාරයෙන් මේ බව දක්වා ඇත. මෙහි ඇති වගාපතක සලකුණින් රාජකීයත්වය ගෞරව සංකේතයද පැලක් මෙන් සලකුණු මගින් හංසයාද නිරූපිතය. හංසයා සලකුණ භාවිත කරන්නේ දෙන ලද දීමනාවේ පවිත්‍රතාවයයි. එහි ඇති අඩසඳ ලකුණෙන් එම දීමනාව ඉරහඳ පවතින තාක් කල් පවතින බවත් බල්ලා සහ කපුටා යන සලකුණු මගින් එයට හානි කරන්නවුන් (අල්ලස ලබා දෙන්නන්) මතු ආත්ම-යේ එවැනි සතුන්ව ඉපදෙන බවයි. මෙවන් වූ ඉහළ සමාජ මට්ටමක් අපට තිබූ බව වර්තමාන සමාජයට මතක නැතුවාක් මෙන් සිටීම ඔවුන් ඔවුන්ටම කරන ලද මහා අකටයුතු කමකි. මෙරට පාලනය කල රජවරු පැරණි සමාජ වතාවරණය නිසි අයුරින් ආරක්ෂා කිරීමට නිබඳව වෙහෙසුණි. අල්ලස හා දූෂණය මැඩ පැවැත්වීමටනම් පැරණි සමාජ නීති රීති ගැන මනා අවබෝධයකින් යුතුව පූර්ව අධ්‍යනයක් කල යුතුය.

වර්තමාන සමාජයේ සමාජ ආචාරධර්ම ගිලිහී යමින් පවතින තත්ත්වයකදී මෙසේ අල්ලස හා දූෂණය රජයන තත්ත්වයක් උද්ගත වීම පුදුම යට පත්වීමට කරුණක් නොවේ. මෙම සමාජයට නිවැරදි සමාජ ආචාරධර්ම සුරකින-වානම් මෙම උද්ගත වී ඇති තත්ත්වය වළක්වා ගැනීමට හැකියාව ඇත. එකල පෙරදිග ලෝකයේ තිබෙන මුතු ඇටය යැයි නම ලැබූවත් වර්තමානයේ ශ්‍රී ලංකාව සමාජ සාරධර්මවලින් ගිලිහී යන බැවින් විදේශ විනිමය මෙන්ම අන්තර් ජාතික සැලකිල්ල කීර්තියෙන් පහළ මට්ටමකට අඩු වී ඇත. මෙම තත්ත්වය මඟ හරවා ගැනීමටනම් අල්ලස සහ දූෂණය මෙරටින් අතුගෑ දැමිය යුතුය. නැත්නම් මේ කුඩා දිවයිනට අනාගතයක් අහිමි වීමට ඉඩ ඉන්නාව ඇත.

වර්තමාන සමාජයේ ඇතැම් ආයතනවලද අල්ලස හා දූෂණය රාශි වශයෙන් පවතී. එවැනි අල්ලස් දූෂණ වලක්වා ගැනීමේ ආයතනද රාශි වශයෙන් පිහිටුවා ඇතත් මේ එක එකක් ඒවා කුමන පරිපාලනයකින් තොරව පවතී. මෙවැනි වැඩකට නැති ආයතන නිසා රජය දිනකට ලබන පාඩුවද සුළු පටු නොවේ. මෙම නිසා රටේ නොයෙක් අක්‍රමිකතා ඇතිවෙමින් පවතී. නූතන යුගය වන විට සෑම ගැටලු අවම කර ගැනීමට යොදා ගත හැකි උපක්‍රම රාශියක් තිබුණත් ඒවා භාවිතයට නොගන්නේ අල්ලස් හා දූෂණය මැඩ පැවැත්වීම නොහැකි වීම නිසාදැයි සැක සහිතය. රජයේ යම් යම් අක්‍රමිකතා වලක්වා ගැනීමට යොදා ගන්නේද මෙවැනි අල්ලස් හා දූෂණය. ශ්‍රී ලංකාව දියුණු රටක් නොවීමට ප්‍රධාන වශයෙන්ම බලපා ඇත්තේ අල්ලස් හා දූෂණය බව නොඅනුමානය. රටක් නගා සිටුවිය හැක්කේ අල්ලස හා දූෂණය පිරුණු සමාජයක නොව සාරධර්ම පුරකින, විනය ගරුක, යහපත් සමාජ රටාවක් ඇති කිරීමෙන් පමණය. යම් යම් පුද්ගලයින් යම් යම් ආයතන තුළද මෙම අල්ලස හා දූෂණය හිඟවෙමින් පවතී. මේ නිසා සෑම ආයතන අකාලයේ වසා දැමීමට සිදුවන්නේ අල්ලස හා දූෂණය නිසා බව නම් නියතය. වර්තමානයේ කුඩා දරුවන් හට වැඩිහිටියන් ඉගැන්විය යුතු මූලික කරුණ නම් සමාජයේ විනයගරුකව හා යහපත්ව සිටීමට හැකි සෑම යහපත් ගුණාංගයක්ම තමා වෙත ළඟා කර ගත යුතු බවය. මෙයින් අනාගත ලෝකය තෙල් සිඳී යන පහනකට තෙල් දැමුවක් මෙන් එහි ආලෝකය තීව්‍ර කිරීමයි. යම් දරුවකු අනාගත ලෝකය පාලනය කිරීමට අදහස් කරන්නේනම් මූලිකවම කළ යුතු ප්‍රථම කාර්යය වන්නේ අල්ලස් හා දූෂණය මෙම සමාජයෙන් මුලිනුපුටා දැමීමයි. ශ්‍රී ලංකාව මුළු මහත් දරණී තලයේම ඔසවා තැබිය හැකි වන්නේ අල්ලස හා දූෂණයෙන් විනාශයට පත් වී තිබූ යහපත් සමාජය යළි නගා සිටුවීමයි. මේ සඳහා ලොකු කුඩා සියලු පුරවැසියන් එකට එක්ව සහයෝගයෙන්, ක්‍රියාශීලීව කටයුතු කළ යුතුය. එය අපගේ ඒකායන අරමුණ කර ගත යුතුය. එවිටයි මේ කුඩා දිවයින ඒකීය නිවහල් රාජ්‍යයක් බවට පත් කර ගත හැකි වන්නේ.' අල්ලස හා දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට නම් අපගේ අනාගත පරපුර සාරධර්ම වලින් ස්වයං පෝෂිත කළ යුතුය. තවද ශ්‍රී ලං-කාව පෙරදී තිබූ තත්ත්වයට ඔසවා තැබිය හැකි. අනාගතය සැලසුම් කිරීමට ඉතිහාසයෙන් ලැබෙන ඒ මහඟු දායකත්වය සුළුපටු නොවන්නේය. ඒ නිසා අප අද සිටම සාරධර්ම පුරකිමින්, දූෂණයෙන් හා වංචාවෙන් තොර සමාජ රටාවක් කරා යායුතු මාර්ගය විවර කර ගත යුතුය. සුන්දරත්වයෙන් අනූන වූ ශ්‍රී ලංකාව යහපත් සාරධර්මවලින්ද සුපෝෂිත කිරීමේ මහඟු කර්තව්‍යය භාර ගත යුත්තේ අනාගත පරපුර වන අපයි. ඒ නිසා අප අද සිටම පරිපාලනය හා සාරධර්ම අපගේ ජීවිතයට ළඟා කොටගෙන ඉදිරියේ අපගේ රටේ මේ තිබෙන තැනට වඩා ඉතා උසස් මට්ටමකට ළඟා කරනු ලබන්නට ප්‍රතිඥා දීමෙන් අල්ලස හා දූෂණයෙන් තොර නිදහස් නිවහල් රාජ්‍යයක් බවට පත් කිරීමට අධිෂ්ඨාන කළ යුතු වෙමු.